**අම්පාර නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**---------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම
-----------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 06 දින සභාවේ ලේකම්වරයාට යවන ලදී.

### 1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අම්පාර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෙජරය අනුව කඩ කාමර කුලී සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල් ගෙවා අවසන් කොට තිබියදී සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශේෂ පත්‍රයේ ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස රු.102,151ක් දක්වා තිබූණෙන් ශේෂ පත්‍රයේ ආපසු ගෙවිය යුතු තැන්පතු වටිනාකම රු.102,151ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ලෙජරයට අනුව මුද්දර ගාස්තු ආදායම රු. 523,000 ක් වූවද, සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.351,787ක් ලෙස ආදායම් හා වියදම් ගිණුමට ගෙන තිබුණි. ඒ අනුව ආදායම් හා වියදම් ගිණුමේ රු.171,213ක් අඩුවෙන් ආදායම දක්වා තිබුණි.

(ඇ) ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඇති තොගය රු.1,530,782 ක් වුවද, ශේෂ පත්‍රයේ එම දිනට අතැති තොගය ලෙස රු.4,416,625ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වෙනත් ආදායම් වල එකතුව රු.10,769,753 ක් ලෙස උප ලේඛණයේ සඳහන් කර ඇතත්, ආදායම් හා වියදම් ගිණුමේ රු.10,935,968 ක් ලෙස රු.166,215 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසාන දින ශේෂ පත්‍රයේ සේවක ණය ලෙස රු.3,778,481 ක් දක්වා ඇතත්, එම ශේෂය තුල සේවකයින් 05 දෙනෙකුට අදාල රු.235,150 ක ණය ශේෂය ඇතුලත් කර නොතිබුණි. ඒ හේතුවෙන් ශේෂ පත්‍රයේ සේවක ණය ශේෂය රු.235,150 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

---------------------------------------

(අ) ස්ථාවර තැන්පතු රු.25,000 ක් සඳහාවූ තැන්පතු සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ ශේෂ පත්‍රයේ අවිනිශ්චිත ගිණුමේ රු.1,599,391 බැර ශේෂයක් දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී එම අවිනිශ්චිත ගිණුම පෙන්නුම් නොකරන ලදි. එම ශේෂය ඉවත් කිරීම සම්බන්ධ ජර්නල් සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

**1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

--------------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විය.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ)** 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත | 2014 දෙසැම්බර් 31 දිනට රු.6,620 ක් වූ මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.837,616ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.411,022 ක් විය.මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.426,594 ක පසුබෑමක් පෙන්නුම් කෙරේ

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

---------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වරිපනම් ගාස්තු, වෙනත් ආදායම් හා ආදායම් ආධාර සියයට 25 සිට සියයට 66 දක්වා පරාසයක වර්ධනයක් පෙන්නුම් කල අතර, සේවා සඳහා ගාස්තු, වරෙන්තු ගාස්තු හා දඩ මුදල් ආදායම සියයට 11.5 සිට සියයට 30 දක්වා පරාසයක පසුබෑමක් නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා වියදම සියයට 41 සිට සියයට 299 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | | **රු.000** | **රු.000** |
| (i) | වරිපනම් හා බදු | 9,826 | 19,021 |
| (ii) | කුලී | 5,244 | 259 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,642 | 981 |
| (iv) | සේවා සඳහා ගාස්තු | 2,989 | - |
| (v) | වරෙන්තු ගාස්තු හා දඩ | 1,008 | 200 |
| (vi) | වෙනත් ආදායම් | 10,935 | 321 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගර සභාව සතු තානායමේ සහ මත්පැන් හලේ පවත්වාගෙන යනු ලබන තැන්පතු ලේඛණය අනුව 2012, 2013 හා 2014 වර්ෂවලට අදාලව එකතුව වූ රු.477,500 ක මුදල මත්පැන් හලේ සේවය කරන නිලධාරින්ට ගෙවිය යුතු මුදලක් වුවද 2012 වර්ෂයේ සිට එම නිලධාරීන්ට නොගෙවා තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) 2011 සහ 2012 වර්ෂවලට අදාලව තානායම් තැන්පතු ගිණුමේ රු.219,000 ක මුදලක් රඳවාගෙන තිබෙන අතර, මෙම මුදල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රථවාහන සඳහා වාර්ෂිකව දුම් පරීක්ෂණ සහතිකය හා ආදායම් බලපත්‍රය ලබාගත යුතු වුවද, සභාව සතු වාහන 30 ක් සඳහාම ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) රථ වාහන සඳහා වාර්ෂිකව රක්ෂණ සහතික ලබාගත යුතු වුවද, සභාව සතු වාහන 11 ක් සඳහා 2014 වර්ෂයේ රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි.

(ඇ) අම්පාර නගර සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් රු.5,455,994 ක ණය මුදලක් ලබාගෙන තිබුනු අතර, එම ණය මුදලට අදාල පොලිය සහ වාරික නොගෙවීම නිසා

2014 දෙසැම්බර් 31 දිනට හිඟව ඇති ණය ප්‍රමාණය රු.,678,348ක් සඳහා රු.884,945 ක හිඟ පොලී මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවට වාරික වශයෙන් යැවිය යුතු එකතුකල අගය මත බදු මුදල (VAT) 2009 වර්ෂයේ සිට ප්‍රේෂණය නොකර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.3,087,182 ක් බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර සියයට 01 සිට සියයට 16692 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින්, අයවැය ලේඛණය විධිමත් සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය